**ශීර්ෂය 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2024**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024ට අනුකූලව, සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරිම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 08 කට අදාලව එකතුව රු.217,916,613 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.195,806,143 ක් වැය නොකර ඉතිරි වී පැවතුණ අතර, එය වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 සිට 94 දක්වා වූ පරාසයක පැවතුණි. . | ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 පරිදි ප්‍රතිපාදන ප්‍රශස්ථ ලෙස උපයෝජනය කරමින් වියදම් පිරිමැසීමෙන් යුතුව සිදු කිරීම සහ අපේක්ෂිත වියදම් වර්ෂය තුල මතු නොවීම මත මෙම ඉතිරිවීම් සිදු වී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, නිවැරදිව හා තාත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | 244-1-1-0-2103 දරන වැය විෂය සඳහා මු.රෙ.66 මඟින් රු.2,421,620 ක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර, එය එම වැය විෂයයේ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 242 ක් විය. | මෙම දෙපාර්තමේනතුවේ භාවිතා කරන පරිගණක හා පරිගණක උපාංග වර්තමාන තාක්ෂණය සමඟ කාලානුරූපී නොවීම සහ ප්‍රමාණවත් පරිගණක උපාංග නොමැතිවීම මත එම භාණ්ඩ මිලදී ගැනීම සඳහා මෙම ප්‍රතිපාදන මාරුකර ගැනීම සිදු කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, නිවැරදිව හා තාත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)**<br>සාර්ක් කලාපීය රටවල් 8 ක සහභාගීත්වයෙන් පිහිටුවාගෙන ඇති දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (සැෆ්තා / SAFTA) සඳහා ශ්‍රී ලංකාව 2005 වර්ෂයේදී අත්සන් කර තිබුණි. මෙම වෙළඳ ගිවිසුමේ වෙළඳාම ලිහිල්කරණ වැඩසටහනේ දෙවන අදියර අවසාන බාණ්ඩය යටතේ සකස් වී ඇති රේගු සංකේතාංක 50 (සංකේත 8 කින් යුත්) සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන තීරු බදු කපා හැරීම සියයට 7.5 හා සියයට 6 ක ප්‍රමාණය 2018 දෙසැම්බර් මාසය වන විට සියයට 5 දක්වා අඩු කිරීමට යෝජනා වී තිබුණ ද, එකී කටයුතු ඉටුකිරීමට හෝ අවශ්‍ය උචිත එකඟතාවයන් වෙත එළඹීමට අවශ්‍ය කටයුතු සැළසීම සඳහා සාධනීයව කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව 2024 දෙසැම්බර් 31 දිනවන විටත් අපොහොසත්වී තිබුණි. | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ වෙළඳාම ලිහිල්කරන වැඩසටහනේ, දෙවන අදියරේදී වරණීය තීරුබදු ප්‍රතිශතය 7.5% සහ 6% ලෙස පැවති භාණ්ඩ වර්ග 50 කට අදාළ සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල වරණීය තීරුබදු අනුපාතය 5% සීමාව දක්වා අඩු කිරීම සඳහා අංක MF/TIP/09/CM/2014/188 සහ 2019.06.11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබුණි. එම අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඉදිරිපත් කර තිබූ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් මෙතෙක් තීරණය කර නොමැති අතර මෙම ගිවිසුමට අදාළ සාකච්ඡා එහි සාමාජික රටවල සහභාගීත්වයෙන් නොපැවතුණු බැවින් මෙම කටයුතු දැනට තාවකාලිකව නැවතී ඇත. | ගිවිසුම අනුව කටයුතු ඉටුකිරීමට හෝ අවශ්‍ය උචිත එකඟතාවයන් වෙත එළඹීමට ප්‍රමාදයන්ගෙන් තොරව ක්‍රියාමාර්ග ගතයුතු වීම. |
| (ආ) **බංගලාදේශය - ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA)**<br>ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වරණීය වෙළඳ ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් වන සාකච්ඡා ආරම්භ කිරීම සඳහා 2021 ජුනි 14 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී තිබුණි. එම කාර්යයට අදාළව ඉදිරිපත් කර තිබූ දත්ත අනුව, 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වෙළඳාමෙන් යහපත් වෙළඳ ශේෂයන් සහ ඉහළ ආනයන ආවරණ අනුපාතයක් දෙරට අතර වෙළඳාම මගින් අය කර ගෙන | මෙම ගිවිසුම අත්සන් කිරීමට අදාළ ආරම්භක වැඩ සැලැස්මෙහි 2022 ජනවාරි මාසයේදී ගිවිසුම අත්සන් කිරීමට ඉලක්කගත කොට තිබුණ ද, එම දිනය පිළිබඳව ඉදිරි දිනයකදී තීරණයක් ගැනීමට අදාළ වැඩ සැලැස්මෙහි ම එකඟ වී ඇත.වැඩ සැලැස්මෙහි යෝජිත දින වකවානු මාර්ගෝපදේශයක් බවත් , ඉදිරි සාකච්ඡාවන්හි ප්‍රගතිය අනුව අන්‍යෝන්‍ය එකඟතාවයන් මත අවශ්‍ය සංශෝධන සිදු කළ හැකි | එකඟතාවය අනුව කටයුතු කිරීමට හෝ අවශ්‍ය උචිත එකගතාවයන් වෙත එළඹීමට ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| තිබුණි. ඒ අනුව, බංගලාදේශය - ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA) අත්සන් කිරීමට අදාළ වැඩ සැලැස්මක් (Work Plan) සඳහා එකඟතාවයකට පැමිණ, දෙරට අතර ගිවිසුම අත්සන් කිරීම 2022 ජනවාරි මසට යෙදී තිබුණ ද, එකඟතාවය අනුව එකී කටයුතු ඉටුකිරීමට සඳහා සාධනීයව කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව 2024 දෙසැම්බර් 31 දින දක්වාත් අපොහොසත්වී තිබුණි. | බවත් වැඩිදුරටත් එහි සඳහන් කර ඇත.<br>අනතුරුව, 2023 මැයි මස 29 දින පැවති මාර්ගගත සාකච්ඡා වටයේ දී ඉදිරිපත් කර ඇති සංශෝධිත වැඩ සැලැස්ම අනුව, මෙම ගිවිසුමට අදාලව සාකච්ඡාවන් තවදුරටත් කෙරෙමින් පැවතුනද, මේ වන විට බංගලාදේශයේ පවතින තත්වය මත මෙම වර්ෂයේ වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු පිළිබඳ කිසිදු ප්‍රතිචාරයක් බංගලාදේශය පාර්ශවයෙන් සිදුව නැත. පාර්ශවයන් දෙකක් අතර ඇති කර ගනුලබන ගිවිසුමක් සම්බන්ධයෙන් එක් පාර්ශවයකට පමණක් ඒක පාර්ශ්වික තීරණ ගත නොහැක. | |
| (ඇ) **චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම**<br>චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ එකඟතාවයට එළඹීම සම්බන්ධ සාකච්ඡා 2014 වර්ෂයේ ආරම්භ වී 2017 වර්ෂය දක්වා පවත්වා තිබුණි. 2022 වර්ෂයේදී සාකච්ඡා නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින වන විටත් සාකච්ඡා මට්ටමේ පවතින බව නිරීක්ෂණය විය. | මෙම යෝජිත ද්විපාර්ශ්වික ගිවිසුමෙහි 07 වන සාකච්ඡා වටය පැවැත්වීමට යෝජිත කාලයන් පිළිබඳව මෙතෙක් දෙරට අතර එකඟතාවයක් ඇති වී නොමැත. | එකඟතාවය අනුව කටයුතු කිරීමට හෝ අවශ්‍ය උචිත වෙනත් එකඟතාවයන් වෙත එළඹීමට ප්‍රමාදයන්ගෙන් තොරව ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

## 4.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් වටිනාකම රු. 7,400,000 ක් වූ වාහනය ලියාපදිංචි අයිතිය පැවරීමකින් තොරව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට ලබා දී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අපහරණය කිරීම් යටතේ එය දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ මෝටර් රථයක් එවකට අධ්‍යක්ෂ ජනරාල් විසින් භාවිත කරන ලදුව පසුව වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් ලෙස එම නිලධාරියා පත්වීම ලැබීමේ දී අදාල රථය මුදල් අමාත්‍යාංශයට ලබා දීමට තීරණය කරන ලදී. ඒ අනුව, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අංක TIP/ADM/05/13/08-01 සහ 2024 දෙසැම්බර් 20 දිනැති ලිපිය මඟින් මෙම මෝටර් රථය මුදල් අමාත්‍යාංශය | විධිමත් පරිදි මෙම වාහනය පවරාදීමට කටයුතු කිරීම. |

වෙත භාර දී ඇති බැවින් එහි වටිනාකම මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් වලින් ඉවත් කර ඇත.

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 63 ක් වූ අතර ඉන් තනතුරු 06 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජොෂ්ඨ මට්ටමේ තනතුරු 01 ක් ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 01 ක් ද සහ ද්වීතියික මට්ටමේ තනතුරු 04 ක් ද විය. ඒ අනුව පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | 2024 දෙසැම්බර් මස, 31 දින වන විට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 64 අතරින් පුරප්පාඩු වූ ජොෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පුරවා ඇති අතර අනෙකුත් පුරප්පාඩු වී ඇති තනතුරු නුදුරේදී පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වමි. | අවශ්‍ය පරිදි පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

.